**ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය - 2020**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---

ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාව, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09 හි 15 ඡේදය ප්‍රකාරව, අවසන් තොගවල වටිනාකම පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකම්වලින් වඩා අඩු අගයට අගය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත් තොගවල ශුද්ධ උපලබ්ධි අගය සලකා බැලීමකින් තොරව රු.7,316,611 ක් වූ පොත් අගය මත තොග වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ගිණුම් ප්‍රකාශන වල තොග වටිනාකම ප්‍රමිතයට අනුකූලව පෙන්වීමට 2021 වර්ෂයේ දී කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතයේ පරිදි තොගවල වටිනාකම පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකම්වලින් අඩු අගයට අගය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයට අයත් ඉඩම් හෙක්ටයාර 431.78 ක නාමික වටිනාකම ලෙස රු.4,237,430 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු නමුත් එම ඉඩම් ප්‍රත්‍යාගණනය කර ඒවායේ සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | මණ්ඩලයට අයත් ඉඩම් ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කරන ලෙස 2018 සැප්තැම්බර් 07 දින රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලා ඇත. තවද මේ පිළිබඳව ඔවුන් හමු වී සාකච්ජා කර ඇති අතර එම කාර්යය ඉටු කර ගැනීමට නොහැකි විය. නැවත මිල ගණන් කැඳවා සුදුසුකම් ලත් තක්සේරුකරුවකු මාර්ගයෙන් | ඉඩම්වල වටිනාකම ප්‍රත්‍යාගණනය කර ඒවායේ සාධාරණ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වීමට කටයුතු කළ යුතුය. |

ඉඩම් ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර මූල්‍ය වාර්තා වල පෙන්වීමට කටයුතු කරනු ලැබේ.

### 1.5.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xv පරිච්ඡේදයේ 4:7 වගන්තිය | අධ්‍යයන කටයුතු සඳහා වැටුප් සහිත නිවාඩු ලබා විදේශගත වී බැඳුම්කර කොන්දේසි කඩකළ නිලධාරීන් 04 දෙනෙකුගෙන් වර්ෂ 29 සිට වර්ෂ 03 දක්වා කාලය තුළ මණ්ඩලයට අයවිය යුතු ශේෂ එකතුව රු.3,509,706 ක් සම්බන්ධයෙන් එම ශිෂ්‍යත්වලාභීන්ගෙන් අයකර ගෙන නොතිබුණි. | මෙම නිලධාරින්ගෙන් 03 දෙනෙකු ආයතනයට අයවිය යුතු මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇතත් ලිපිනයන් සොයා ගැනීමට නොහැකි වීම නිසා මෙම නඩු බහා තබා ඇත. ඒ අනුව, ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට නොහැකි වී ඇත. එක් නිලධාරියකුගෙන් 2007 ඔක්තෝම්බර් මස 04 වන දින මුදල් ගෙවා ඇති බවට තොරතුරු සොයා ගෙන ඇති බැවින් අදාළ නිවැරදි කිරීම් කටයුතු 2021 වර්ෂයේදී කරනු ලැබේ. | විදේශගතවී බැඳුම්කර කොන්දේසි කඩකළ නිලධාරීන්ගෙන් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව එම මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන භාණ්ඩාගාර ලේකම්ගේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | ඇස්තමේන්තු වටිනාකම රු.4,900,000 ක් වූ වසර 39 ත් 30 ත් අතර කාලයක් පැරණි වාහන 07 ක් භාවිතයෙන් ඉවත් කර වසර 01 ත් 07 ත් අතර කාලයක් ගතවී තිබුණද, එම වාහන අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ආයතනයේ පැරණි වාහන 7ක් ඉවත් කිරිම සඳහා හඳුනාගෙන ඇති අතර එම වාහන භාණ්ඩාගාර වත්කම් කළමණාකරණ චක්‍රලේඛ අංක 1/2018 අනුව අපහරණය කිරිම සඳහා 2021 වසරේ මුල කටයුතු ආරම්භ | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව නොපමාව වාහන අපහරණය කළ යුතුය. |

කළ නමුත් කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් අපහරණ කටයුතු ප්‍රමාද විය. කෙසේ නමුත් එම කටයුතු හැකි ඉක්මණින් නිම කර වාහන අපහරණය කිරිමට කටයුතු කරනු ලැබේ.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.10,858,981 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.53,790,676 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.64,649,657 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ ප්‍රදාන වැඩිවීම සහ වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

#### 2.2.1 ආදායම්

- සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු ප්‍රදාන සමඟ මණ්ඩලයේ මුළු ආදායම රු.662,812,891 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයේ රු.666,913,740 ක් වූ මුළු ආදායම සමඟ සැසඳීමේදී සියයට 0.61 ක පහළ බැසීමක් විය. රජයේ ප්‍රදාන හැර, වතුවල දළ ලාභය හා වෙනත් ආදායම් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී රු. 28,066,652 කින් හෙවත් සියයට 42.02 කින් වර්ධනයවී තිබුණි.

- මණ්ඩලයට අයත් වතු හතර අතුරින් වතු තුනක් සමාලෝචිත වර්ෂයේදී අලාභ ලබා තිබුණු අතර එක් වත්තක් පමණක් ලාභ ලබා තිබුණි. ඉකුත් වර්ෂයේදී රු.4,876,303 ක් වූ කුමාරවත්තෙහි අලාභය සමාලෝචිත වර්ෂයේදී රු.7,495,284 ක් දක්වා වැඩිවීමක්ද , ඉකුත් වර්ෂයේ රු. 8,811,453 ක අලාභයක් ලැබූ ඩාර්ටන්ෆිල්ඩ් වත්ත සමාලෝචිත වර්ෂයේදී රු.615,573 ක අලාභයක්ද , ඉකුත් වර්ෂයේ රු.33,678 ක් වූ නාරම්පොල වත්තේ අලාභය සමාලෝචිත වර්ෂයේදී රු.1,248,954 ක් දක්වාද වැඩි වී තිබුණි.

#### 2.2.2 වියදම

සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මුළු වියදම රු. 651,953,909 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ මුළු වියදම වූ රු. 720,704,416 ක සමඟ සැසඳීමේදී සියයට 9.5 ක අඩුවීමක් විය.

### 2.3 අනුපාත විශ්ලේෂණය

| අයිතම | සමාලෝචිත වර්ෂයේ වටිනාකම | ඉකුත් වර්ෂයේ වටිනාකම | ඉකුත් වර්ෂය සමඟ වෙනස් වීම | ඉකුත් වර්ෂය සමඟ වෙනස් වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| ජංගම නොවන වත්කම් | 684,634,797 | 658,988,975 | 25,645,822 | 3.89 |

| | | | | |
|---|---|---|---|---|
| ජංගම වත්කම් | 186,048,139 | 167,780,816 | 18,267,323 | 10.88 |
| ජංගම වගකීම් | 61,106,509 | 97,756,040 | (36,649,531) | (37.49) |
| ජංගම නොවන වගකීම් | 151,253,846 | 143,314,133 | 7,939,713 | 5.54 |
| ස්කන්ධය (ප්‍රාග්ධන සහ සංචිත) | 658,322,581 | 585,699,618 | 72,622,963 | 12.39 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය විසින් මොනරාගල කුමාරවත්ත සහ පොල්ගහවෙල නාරම්පොල වත්ත යන උප මධ්‍යස්ථාන 02 හි රු.16,301,964 ක් වැයකර කාර්යාල ගොඩනැගිලි ඉදිකර තිබුණද, එම ඉඩම් නීත්‍යානුකූලව මණ්ඩලයට මෙතෙක් පවරා ගෙන නොතිබුණි. | මොනරාගල කුමාරවත්ත සහ පොල්ගහවෙල නාරම්පොල වත්ත ආයතනයට පවරා ගැනීම සඳහා අවශ්‍ය සියලු කටයුතු සම්පාදනය කර අමාත්‍යාංශය වෙත 2018 නොවැම්බර් 01 දින යොමු කර ඇත. අමාත්‍යාංශය මගින් අදාළ පවරා ගැනීම් කටයුතු කිරිම සඳහා 2018 නොවැම්බර් 28 දින ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත අදාළ තොරතුරු ඉදිරිපත් කර ඇත. | නොපමාව ඉඩම් පවරා ගත යුතුය. |
| (ආ) | මණ්ඩලයේ වර්ෂ 05 ට වඩා වැඩි කාලයක් පැවති එකතු වටිනාකම රු.5,883,524 ක් වූ ණයගැති ශේෂ 19 ක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා නොගෙන කපාහැර තිබුණි. මෙම කපාහැරීම පිළිබඳව මූල්‍ය ප්‍රකාශනයේ සටහනක් ඉදිරිපත් කර නොතිබුණි. | ණයගැති නිශ්කාෂන ගිණුමේ අඩංගු ණයගැතියන් ලෙස හදුනාගත නොහැකි ශේෂ නිරවුල් කිරිමට කටයුතු කර ඇත. | ණයගැතියන් කපා හැරීමට පෙර අයකර ගැනීමට නොහැකි වීමට හේතු අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් 2016 - 2022 කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිතවූ විශේෂ ව්‍යාපෘති 07 ක් සැලසුම් කර ඒ සඳහා රු.මිලියන 199.95 ක් ප්‍රතිපාදන සලසා තිබුණි. එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂයට | විශේෂ ව්‍යාපෘති වලට අදාළ කාර්යසාධන වාර්තා නියමිත කාලවලට සකස් කර අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | මණ්ඩලය විසින් සැලසුම් කරන ලද ව්‍යාපෘතිවල කාර්ය සාධනය වාර්තාවල ඉදිරිපත් කළ යුතුය. |

රු.මිලියන 54.65 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර කාර්යසාධන වාර්තාව අනුව රු.මිලියන 5.63 ක් ප්‍රතිපාදන සලස්වා තිබුණු ව්‍යාපෘති 03 ක කාර්යසාධනය ඉදිරිපත් කර නොතිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ ප්‍රධාන පර්යේෂණ නිලධාරී තනතුරු 10 ක් ද, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී තනතුරු 16 ක් ද , පර්යේෂණ නිලධාරී තනතුරු 10 ක් ද, ජ්‍යෙෂ්ඨ උපදේශන නිලධාරීන් 02 ක්ද, උපදේශන නිලධාරීන් 02 ක්ද, පර්යේෂණ නිලධාරී 03 ක් ද, වශයෙන් පර්යේෂණ කටයුතු වලට අදාළව තනතුරු 43 ක පුරප්පාඩු 2021 ඔක්තෝබර් 30 දින වනවිටත් පැවතිණි. ඒ හේතුවෙන් ආයතනයේ මූලික අරමුණ වූ පර්යේෂණ කටයුතු පවත්වා ගැනීමට මෙය බාධාවක්වී තිබුණි. | 2021 වසරේදී මේ සඳහා අයදුම්පත් කැඳවන ලද අතර, එම තනතුරු පිරවීම සඳහා අවශ්‍ය කටයුතු දැනට සිදුකරමින් පවතී. එහෙත්, බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවීමට රජය විසින් ලබාදුන් නියෝගය හේතුකොට ගෙන අදාළ බඳවා ගැනීම් සිදුකිරීමට මෙතෙක් නොහැකි වී ඇත. | මෙම පුරප්පාඩු පිරවීමට හෝ සේවා අවශ්‍යතාවය නැවත සලකාබලා අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනයට පියවර ගත යුතුය. |